**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

********

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය ගුවන් හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් රාකේෂ් කුමාර් සිං භාදෝරියා මැතිතුමා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සර සැමරුමට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණේ

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සර සමරුම් සහ අංක 5 ප්‍රහාරක බලගනය සහ අංක 6 හෙලිකොප්ටර් බලගනය වෙත ජනාධිපති වර්ණ පිරිනැමීම 2021 මාර්තු 02 වන දින ආරම්භ විය. PVSM, AVSM සහ VM ආදී සම්මානලාභී ඉන්දීය ගුවන් හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් රාකේෂ් කුමාර් සිං භාදෝරියා මැතිතුමා මෙම වැඩසටහන් සඳහා සහභාගී වීම සඳහා 2021 මාර්තු 03 වන දින ශ්‍රී ලංකාවට පැමිණියේය.

සිය සංචාරයේදී එතුමා ශ්‍රී ලංකාවේ 70 වන සංවත්සරය නිමිත්තෙන් ගාලු මුවදොරදී පවත්වනු ලබන ගුවන් සරඹ සංදර්ශනය නැරඹීමට ශ්‍රී ලංකා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සමඟ එක් විය . එකමුතුබව සහ වසර ගණනාවක සිට දෙරට අතර පවතින අන්තර්ක්‍රියා සහ සහෝදරත්වය පිළිඹිබු කරමින් ඉන්දීය ගුවන් හමුදාව සහ ඉන්දීය නාවික හමුදාව ගුවන් සරඹ සංදර්ශනය සඳහා සහභාගී වේ.

දෙරට අතර ශක්තිමත් සබඳතා සහ සමීප සහයෝගිතාවය මෙම සංචාරය මගින් පෙන්නුම් කෙරේ. පොදු ආරක්ෂාව සහ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාවන්ට අදාළ කරුණු මෙම සංචාරයේදී සාකච්ඡා කෙරෙනු ඇත. මෙම වැඩසටහන් කොවිඩ් මාර්ගෝපදේශයන් දැඩිව අනුගමනය කරමින් පැවැත්වෙනු ඇත. ශ්‍රී ලංකාව ඉන්දියාවේ “පළමු ප්‍රමුඛත්වය” හිමිවන සහකාර රාජ්‍යය වන අතර දෙරට අතර වර්ධනය වන සහෝදරත්වය සහ මිත්‍රත්වය මෙම සංචාරයෙන් පිළිඹිබු කෙරේ.

***

**කොළඹ**

**2021 මාර්තු 03**